# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1979 අංක 3 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල: ශත 30 යි

තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 32/78.

පළාත් පාලන සේවයේ සාමාජිකයන් නොවන පළාත් පාලන ආයතනවල නිලධරයන්ගේ සහ සේවකයන්ගේ විනය පාලනයට සහ ඔවුන් සේවයෙන් පහ කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*පනත අදාළ කිරීම.*

2. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයකු නොවන මෙහි මින් මතු "මේ පනත අදාළ වන්නා වූ සේවානියුක්තයකු" යනුවෙන් හඳුන්වනු ලබන, යම් පළාත් පාලන ආයතනයක සෑම නිලධරයකුට හෝ සේවකයකුට අදාළ විය යුතු ය.

*මේ පනත අදාළ වන්නා වූ සේවා නියුක්තයන්ගේ විනය පාලන කටයුතු සහ සේවය අවසන් කිරීම සම්බන්ධ කාර්ය පටිපාටිය.*

3. (1) මේ පනත අදාළ වන්නා වූ යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් ප්‍රස්තුත පළාත් පාලන ආයතනය විසින් විනයානුකූලව කටයුතු කරනු ලැබූ හෝ ඔහුගේ සේවාවන් අවසාන කරනු ලැබූ අවස්ථාවක දී, එවැනි යම් විනයානුකූල නියමයකින් හෝ සේවය අවසාන කරනු ලැබීමේ නියමයකින් තමා අතෘප්තියට පත් වන්නේ නම්, එම නියමයට විරුද්ධව අමාත්‍යවරයාට ඔහු විසින් එක් අභියාචනයක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාට අභියාචනයක් ලැබුන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ පළාත් පාලන සේවා විනය මණ්ඩලයේ නිර්දේශ ලැබීමෙන් පසුව, පළාත් පාලන ආයතනය විසින් කරනු ලැබූ නියමය අමාත්‍යවරයා විසින් ස්ථිර කිරීම හෝ වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ, පළාත් පාලන ආයතනයක නියමයක් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම, ප්‍රස්තුත පළාත් පාලන ආයතනය සහ සේවානියුක්තයා කෙරෙහි අනුගම්‍ය විය යුතු අතර එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. තව ද එය කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

*විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ විශ්‍රාම දීමනාව නොගෙවීම හෝ ප්‍රමාණවත් නොවන ලෙස ගෙවීම සම්බන්ධ කාර්ය පටිපාටිය.*

4. (1) මේ පනත අදාළ වන්නා වූ යම් සේවානියුක්තයකු යම් පළාත් පාලන ආයතනයක සේවයෙන් විශ්‍රාම ගනු ලැබ, ඔහුට ලැබිය යුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් නොගෙවීම නිසා හෝ එම විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ විශ්‍රාම දීමනාව ප්‍රමාණවත් නොවීම නිසා අතෘප්තියට පත් වන්නා වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි, එසේ නොගෙවීමට හෝ ප්‍රමාණවත් නොවූ ගෙවීමට විරුද්ධව අමාත්‍යවරයාට ඔහු විසින් එක් අභියාචනයක් කළ හැකි ය.

C 38207—13,350 (78/12)

7

CS CamScanner

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාට අභියාචනයක් ලැබුන අවස්ථාවක, එසේ නොගෙවීම හෝ ප්‍රමාණවත් නොවූ ගෙවීම සම්බන්ධයෙන්, ඔහු විසින් ප්‍රස්තුත පළාත් පාලන ආයතනයට විධාන කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් දෙනු ලැබූ සෑම විධානයක් ම, ප්‍රස්තුත පළාත් පාලන ආයතනය සහ සේවා නියුක්තයා කෙරෙහි අනුගම්‍ය විය යුතු අතර, එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. තව ද එම විධානය කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

රජයේ නිලධරයකුට බලය පැවරීමට අමාත්‍යවරයාට ඇති බලය.

5. (1) (අ) සේවය අවසාන කිරීමේ නියමයක් මත කරනු ලැබූ අභියාචනයක් හැර, 3 (1) වන වගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක් ;

(ආ) 4 (1) වන වගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක්

විභාග කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල යම් රජයේ නිලධරයකුහට පැවරීම අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, බලය පැවරුම්ලාභී තැනැත්තා, පළාත් පාලන ආයතන සේවා විනය පාලක මණ්ඩලයේ නිර්දේශය ලැබීමෙන් පසු, 3 (1) වන වගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් එම බලතල ක්‍රියාත්මක කළ යුතු ය :

එසේ වුව ද, රජයේ නිලධරයකුහට එසේ බලය පවරනු ලැබීම නොතකා, යම් පළාත් පාලන ආයතනයක නියමයකට විරුද්ධව කරන ලද අභියාචනයක් විභාග කිරීමට ඇති බලය කවර හෝ අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර, එම බලය ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලැබූ නිලධරයා විසින් එවැනි අවස්ථාවක දී, එම බලය ක්‍රියාත්මක නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රජයේ නිලධරයකු විසින් කරන ලද පළාත් පාලන ආයතනයක නියමයක් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම හෝ දෙන ලද විධානයක් ප්‍රස්තුත පළාත් පාලන ආයතනය සහ සේවානියුක්තයා කෙරෙහි අනුගම්‍ය විය යුතු අතර එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය. තව ද, එය කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

මේ පනත අදාළ වන සේවානියුක්ත පක්ෂ කාර්මික ආරාවුල් පනත අදාළ නොවිය යුතු බව.

6. (1) කාර්මික ආරාවුල් පනතේ කුමක් සඳහන් වුව ද, මේ පනත අදාළ වන්නා වූ යම් සේවානියුක්තයකුට හෝ ඔහු සම්බන්ධයෙන් ඒ පනතේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

(2) මේ පනත අදාළ වන සේවානියුක්තයකු පාර්ශ්වකරුවකු වන්නා වූ ද මේ පනත ආරම්භ වන දිනයෙහි විභාගයට භාජනව පවතින්නා වූ ද කම්කරු ආරාවුල් පනත යටතේ කම්කරු විනිශ්චය ධිකාරයකට කරන ලද සෑම ඉල්ලීමක් ම නිෂ්ප්‍රභ විය යුතු ය.

CS CamScanner

(3) යම් ඉල්ලීමක් (2) වන උපවගන්තිය යටතේ නිෂ්ප්‍රභ වන අවස්ථාවක ඒ ඉල්ලීමට පාර්ශ්වකරුවකු වූ මේ පනත අදාළ වන සේවානියුක්තයකු විසින් උචිත පරිදි මේ පනතේ 3 වන හෝ 4 වන වගන්ති යටතේ අමාත්‍යවරයාට ආයාචනා කළ හැකි ය.

පළාත් පාලන ආයතනවලට අදාළ නීති අභිබවා මේ පනත බල පැවැත්විය යුතු බව.

7. මහා නගර සභා ආඥාපනතෙහි, නගර සභා ආඥාපනතෙහි, සුළු නගර සභා ආඥාපනතෙහි සහ ගම් සභා ආඥාපනතෙහි පටහැනිව් කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

රීති.

8. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදිය හැකි ය:—

(අ) අභියාචනය කළ යුතු කාලසීමාව සහ අභියාචනය කළ යුතු ආකාරය ; සහ

(ආ) පළාත් පාලන සේවා විනය පාලන මණ්ඩලය විසින් තම නිර්දේශ ඉදිරිපත් කළ යුතු කාලසීමාව.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ යම් ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"රජයේ නිලධරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.